සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

06 ශ්‍රේණිය — වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 — 21 S

**සිංහල භාෂාව හා සාහිත්‍යය** — කාලය පැය දෙකයි

නම / විභාග අංකය :

සැලකිය යුතුයි :- ● සියලුම ප්‍රශ්න වලටපිළිතුරු සපයන්න.

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර ගණන වන්නේ ,
i) 10 කි. ii) 18 කි. iii) 5 කි. iv) 42 කි.

(02) සිංහල අක්ෂර මාලාව හා සම්බන්ධ වැරදි කියමන තෝරන්න.
i) ස්වරයක් තනිව උච්චාරණය කළ හැකිය.
ii) ස්වරයක් ඊට නියමිත රූපයෙන් ම ලියන්නේ වචනයක මුල් ශබ්දය හැටියට යෙදෙන අවස්ථාවලදී පමණි.
iii) සෑම ව්‍යඤ්ජනයක් ම හල් කළ හැකිය.
iv) ව්‍යඤ්ජනයක් තනිව උච්චාරණය කිරීම අපහසුය.

03) අනුක්ත නාම පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
i) කුරුල්ලෝ , වැඩිහිටියන් , කවීන්. ii) ළමයි , ගුරුවරු , උගතුන්.
iii) ඔවුන් , සිංහයන් , රෝගීන්. iv) දරුවන් , වෛද්‍යවරු , තරුණයන්.

**● 4, 5 ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.**

04) i) රාස්සි ලිපක් පෙන්නුවේය. ii) මා පාඩම් කළෙමි.
iii) ඔවුහු සෙල්ලම් කළෙහු. iv) ළමයා පැළයක් සිටුවයි.

05) i) ගස් සුළඟට සෙලෙවෙති. ii) තාරකා අහසේ බබළති.
iii) ඔවුහු පාඩම් කරති. iv) සමනලයන් මල්පැණි බොති.

06) හිස්තැනට සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.
අඳුර වැටෙත් ම කඳවුරු දෙකෙහි ම රකවල් .................. විය.
i) බිය. ii) බඳ. iii) තර . iv) බර.

07) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචන පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
i) දර්ශනය , විදේශික , ඓතිහාසික ii) ප්‍රතිඵල , ලේඛකයෝ , වායාරූප
iii) ආවේණික , සංරක්ෂණය , පෝෂනය iv) සම්ප්‍රදාය , නිර්මානය , ස්වාධීන

**● පහත ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කිරීමට අදාළ පදය තෝරන්න.**

08) බැද්දට ........................... පැයුවා වගේ.
i) ඉර ii) හඳ iii) තරු iv) මල්

09) වක්කඩේ ........................... හැංගුවා වාගේ.
i) ගොයම් ii) පැණි iii) හකුරු iv) වී

**● 10, 11 ප්‍රශ්නවල විරුද්ධාර්ථ පදය නිවැරදිව යෙදී ඇති පිළිතුර වන්නේ,**

10) i) චංචල - නිශ්චල ii) විශේෂ - සුවිශේෂ iii) පළල - පුළුල් iv) ආරම්භය - පටන්ගැන්ම

11) i පිවිතුරු - පිරිසිදු ii) මිහිරි - ඉමිහිරි iii) නිති - නිබඳ iv) ඇත - මෑත



LIVEWORKSHEETS

12) ප්‍රථම පුරුෂ බහු වචන උක්ත පදයකි.

i) නුඹලා  ii) ගොවියන්  iii) කාන්තාවන්  iv) ගුරුවරු

13) යුගල පදයක් නොවන්නේ,

i) ඉඩම් - කඩම්  ii) රළු - පරළු  iii) උත්තම - අධම  iv) ළමයි - බමයි

• **14, 15 ප්‍රශ්නවල ගැළපෙන තනි පදය තෝරන්න.**

14) රාත්‍රි කාලයේ හැසිරෙන.

i) නිශාචර  ii) වනචර  iii) දිවාචර  iv) ජලචර

15) තමා උපන් රටට ආදරය කරන්නා,

i) දේශප්‍රේමියා  ii) දේශද්‍රෝහියා  iii) ස්වදේශිකයා  iv) පරාධීනයා

• **16, 17 ප්‍රශ්නවල දී ඇති පදයට සමාන පදයක් නොවන පදය තෝරන්න.**

16) සඳ - සොමි, තරිඳු , නිරිඳු, තරුපති

17) මාතෘ භූමිය - මවුබිම , නිජබිම , ජාතභූමි , දිනමිණ

18) පහත සඳහන් වාක්‍යයේ නාම විශේෂණ පදය වන්නේ,

" කියවීම සඳහා හොඳ පොතක් තෝරාගන්න " යැයි ගුරුතුමා පැවසුවේය.

i) ගුරුතුමා  ii) පොතක්  iii) කියවීම  iv) හොඳ

19) නොගැළපෙන පිළිතුර තෝරන්න.

i) කාව්‍යශේඛරය - තොටගමුවේ ශ්‍රී රාහුල හිමි  ii) ගුත්තිල කාව්‍ය - වැත්තෑවේ හිමි

iii) කව්සිළුමිණ - ඊ . තෙන්නකෝන් මහතා  iv) පුංචි පැළේ ගස වෙනා- කේ ජයතිලක මහතා

20) මහාප්‍රාණ අක්ෂර නොයෙදුණු පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

i) ඡන්දය, ස්ථානය, ධර්මය, භයානක  ii) රාක්ෂයා, දණ්ඩ, පොකුණ, කඩය

iii) ධවල, රාජධානිය, අධිෂ්ඨානය, සමෘද්ධිමත්  iv) ප්‍රතිඵල, ආරුඪ, සංඛ්‍යාව, අවබෝධය

( ලකුණු 2 x 20 = 40)



LIVEWORKSHEETS